**ජාතික රුධිර පාරවිලයන සේවයේ වැඩ බලන අධ්‍යක්ෂ වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතාගේ අක්‍රමිකතා, වංචා සහ දූෂණ පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම සඳහා**

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ජාතික රුධිර පාරවිලයන සේවයේ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස 2017 දෙසැම්බර් මාසයේ දී වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා පත් කරන ලදි. පසුගිය ජනාධිපතිවරණය සමයේ දී එවකට පොලොන්නරුව මහා රෝහලේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වත්මන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට අනියම් බිරිඳක් සහ දරුවකු සිටින බවට මාධ්‍ය ඉදිරියේ ප්‍රකාශ කිරීම හේතුවෙන් වැඩ තහනමට ලක් විය.

එසේ වැඩ තහනමට ලක්වීමෙන් පසු ඔහු වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස ජාතික රුධිර පාරවිලයන සේවයට පත් කළද ඒ වන විට ජාතික රුධිර පාරවිලයන සේවයේ අධ්‍යක්ෂවරයා ස්ථාන මාරු ලබා සිටි බැවින් අධ්‍යක්ෂවරයා ගේ බලතල අනුව කටයුතු කිරීමේ අවස්ථාව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ඔහු වෙත ලබා දෙන ලදි.

එම බලතල උපයෝගී කර ගනිමින් මේ වන විට වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා ජාතික රුධිර පාරවිලයන සේවය තුළ අක්‍රමිකතා, වංචා සහ දූෂණ ගණනාවක නිරත වෙමින් සිටියි. ඔහු විසින් සිදු කරන එම අයථා ක්‍රියා ඔබගේ අවධානයට යොමු කර සිටිමු.

1. **ව්‍යාජ ලේඛන සැකසීම**
   ජාතික රුධිර පාරවිලයන සේවය ට නව තාක්ෂණය හඳුන්වා දෙමින් නෙදර්ලන්ත රජයේ ණය ආධාර මත ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර මේවන විට එය අවසාන අදියරට ළඟා වී තිබේ. මෙරට එම ව්‍යාපෘතියේ නියෝජිත ආයතනය ලෙස ෆෝසයිට් ඉංජිනියරින් (Foresight Engineering) නම් ආයතන කටයුතු කරයි. මේවන විට හිදිසි අවශ්‍යතා සඳහා වෙන් කළ ඇමරිකන් ඩොලර් මිලියනයක් පමණ අදාළ ව්‍යාපෘතිය යටතේ පවතින අතර එම මුදල යොදා ගනිමින් එන්ජීඑස් (Next Generation Sequencing) නම් උපකරණයක් ලබා ගන්නා ලෙස මෙරට නියෝජිත ආයතනයට ඔහු විසින් ලිපියක් යොමු කර තිබේ.
   පිළිගත් ටෙන්ඩර් පටිපාටිය පවා උල්ලංඝනය කරමින් ඔහු විසින් යොමු කළ එම ලිපිය මගින් අදාළ උපකරණය ඔහුට හිතවත් සමාගමකින් වසර තුනක ට අවශ්‍ය ප්‍රතික්‍රියක (Reagent) සමග ලබා ගන්නා ලෙස දන්වා තිබේ. මෙවැනි උපකරණයක අවශ්‍යතාවක් දැනට නොමැති අතර එබැවින් ප්‍රතික්‍රියක අවශ්‍යතාව කොපමණද යන්න පවා තීරණය කළ නොහැකිය.
   අදාළ සමාගමෙන් උපකරණය ලබා ගැනීම සඳහා තමාට විශේෂඥ කමිටුවක් මගින් නිර්දේශ කළ බවට ව්‍යාජ තොරතුරු ඔහු විසින් දක්වා තිබේ.

අදාළ ව්‍යාපෘතියේ හදිසි අවශ්‍යතා සඳහා වෙන් කළ මෙම මුදල් කුමන කටයුතු සඳහා යොදා ගත යුතුද යන්න පිළිබඳ ව කැබිනට් අනුමැතිය පවා ලබා ගෙන තිබිය දී ඔහු මෙලෙස කටයුතු කර තිබේ.

රුධිර පාරවිලයන විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය මගින් ඉහත මුදල් වැය කළ යුත්තේ කුමක් අරඹයා ද යන්න පිළිබඳ ඉල්ලීමක් කළ අතර එම ලිපිය ජාතික රුධිර පාරවිලයන සේවයට 2018 මැයි මස 15 වැනි දින ලැබී තිබුණි. ඔවුන්ගේ ඉල්ලීම ලැබීමට පෙර තමා එන්ජීඑස් (Next Generation Sequencing)උපකරණය ගැනීමට කටයුතු කළ බව පෙන්වීම සඳහා 2018 මැයි මස 21 දින වෛද්‍ය බෙල්ලන විසින් සකස් කළ ලිපියේ දිනය මැයි මස 15 වැනි දින ලෙස වෙනස් කරන ලෙස අදාළ ව්‍යාපෘතියේ සම්බන්ධීකරණය කළ වෛද්‍යවරියට ඔහු විසින් තර්ජනය කරන ලදි. අදාළ ලිපියේ දිනය ඔහුගේ අත් අකුරින්ම වෙනස් කර ඇත.

මීට අමතරව පසුගිය වසරේ දී රුපියල් මිලියනයකට වඩා අඩු මුදලක් වැය වූ අධිශීතකරණ නඩත්තු සේවා සඳහා මෙවර ඔහු රුපියල් මිලියන 72 ක ඇස්තමේන්තුවක් යොමු කරමින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට උත්සාහ දරා තිබේ. එයට අවනත නොවූ ටෙන්ඩර් මණ්ඩලයට වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා බැණ වැදී ඇත.

මෙම මිලියන 72 ක ටෙන්ඩරය ලබා දීමට උත්සාහ කර ඇත්තේද ඉහත එන්ජීඑස් උපකරණය ලබා ගන්නා ලෙස ඔහු දක්වා තිබූ සමාගමිනි.

එමෙන්ම එන්ජීඑස් උපකරණය ගැනීම තමාගේ අවශ්‍යතාවක් නොව සෞඛ්‍ය අමාත්‍යාංශයේ උසස් නිලධාරීන්ගේ සහ සෞඛ්‍ය අමාත්‍යවරයාගේ සොහොයුරාගේ අවශ්‍යතාව මත සිදු කරන බව ඔහු ප්‍රකාශ කර ඇත.

ජාතික රුධිර පාරවිලයන සේවය මගින් අතිරික්ත ප්ලාස්මාව විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුව මිළ ගණන් කැඳවා විකිණීම සිදු කරන අතර මෙවර එසේ මිළ ගණන් කැඳවූ ගැනුම් කරුවන් අතර වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතාගේ හිතවතුන් කිහිප දෙනෙකුද වෙයි. මෙම ටෙන්ඩරය සඳහා ප්ලාස්මාව වැඩිම මිළකට මිළ දී ගැනීමට ඒබීසී පාර්මා නම් ආයතනය මිළ ගණන් ඉදිරිපත් කර ඇත. නමුත් එම ආයතනයට අදාළ ටෙන්ඩරය ලබා නොදී තම හිතවත් සමාගමකට එය ලබා දෙන ලෙස ඔහු තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත බලපෑම් සිදු කරමින් සිටී. (එසේ ඔහුගේ හිතවතකුට ලබාදීමක් කළහොත් වසරකට රුපියල් මිලියන 40 ක පාඩුවක් විඳීමට රජයට සිදුවේ)

තාක්ෂණික ඇගයීම් කමිටුව ඔහුට අවනත නොවූ බැවින් තමන්ට හිතවත් විශේෂඥ වෛද්‍යවරුන් කිහිප දෙනකු මාර්ගයෙන් නැවත ටෙන්ඩර් කැඳවීමකට යාමට ඔහු සූදානම් වෙමින් සිටියි.

**2. අක්‍රමවත් ආකාරයට ස්ථාන මාරු සිදු කිරීම**

මේ වන විට වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා ඉතා අක්‍රමවත් ආකාරයට ස්ථාන මාරු සිදු කරමින් පවතී. තමාට එරෙහිව කටයුතු කළ වෛද්‍යවරුන් ජාතික රුධිර මධ්‍යස්ථානයේ වෙනත් අංශවලට යොමු කර ඇත.

දිවයින පුරා ලේ බැංකු 107 ක් ස්ථාපිත අතර එම ලේ බැංකුවල සේවය කරන හෙද නිලධාරීන් ට හිතුමතේට මාරුවීම් ලබා දෙමින් සිටියි. තමා එසේ කරන්නේ තම හිතවතුන්ගේ සහ ඉහළ නිලධාරීන්ගේ අවශ්‍යතාව අනුව බව ඔහු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරයි. මෙය රාජ්‍ය සේවය අපකීර්තියට ලක් කිරීමකි.

**3. වෛද්‍ය රුක්ෂාන් තාක්ෂණික ඇගයීම් කමිටුවල කටයුතුවලට මැදිහත් වෙමින් පෞද්ගලික සමාගම් සමග අයථා ලෙස කටයුතු කිරීම**

වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා ගේ මෙම මැදිහත්වීම සහ තම හිතවත් සමාගම් වෙත පක්ෂපාතී ලෙස ටෙන්ඩර් ලබා දීමේ පිළිවෙත ඔහු සාධාරණීකරණය කිරීමට උත්සාහ දරන්නේ ජාතිවාදී අදහස් ද සේවකයින් තුළ ඇති කරමිනි.

**4. ජාතික රුධිර මධ්‍යස්ථානයට මත්පැන් ගෙන ඒම සහ සේවකයින්ට බෙදා දීම**

ජාතික රුධිර මධ්‍යස්ථානයේ දී 2018 ජුනි මස 14 වැනි දින සංගීත වැඩසටහනක් පැවැති අතර එහි දී වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා සේවක කණ්ඩායම් වෙත මත්පැන් සපයා තිබුණි. එහි දී සේවක කණ්ඩායමක් අතර පහර දීමක් ද සිදු විය. ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය මේ බව අධ්‍යක්ෂවරයා දැනුවත් කර ඇති අතර ඔහු එය විසඳන බව පවසමින් මගහැර තිබේ. මෙලෙස මත්පැන් ගෙන ඒම නුසුදුසු බව වෛද්‍යවරු පැවසූ අවස්ථාවේ ඔහුගේ අදහස වූයේ එසේ නම් එවැනි වැඩසටහන් නොපැවැත්විය යුතු බවයි. ජාතික රුධිර මධ්‍යස්ථානයේ මෙවැනි රසවින්දන වැඩ සටහන් මීට පෙර පැවැති අතර එම කිසිඳු අවස්ථාවක ආයතනයට මත්පැන් රැගෙන ඒමක් සිදු නොවීය.

ඇමිණුම් -

1. මොහු සම්බන්දව කලම්බු ටෙලිග්‍රාෆ් වෙබ් පිටුවේ වරින් වර කරන ලද හෙලිදරව් කිරීම් මේ සමග අමුණා ඇත.
2. මොහු විසින් මාධ්‍ය සඳහා දී ඇති සාවද්‍ය ප්‍රකාශයන් මේ සමග අමුණා ඇත.

මෙයට,
ජාතික රුධිර මධ්‍යස්ථානයේ සියලුම වෛද්‍ය නිලධාරීන්
අත්සන් සහිත පිටු අමුණා ඇත.

**ජාතික රුධිර පාරවිලයන සේවයේ වැඩ බලන අධ්‍යක්ෂ වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතාගේ අක්‍රමිකතා, වංචා සහ දූෂණ පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම සඳහා**

| | Name | Signature |
|---|---|---|
| 1 | Dr. S. P. Rupasinghe | |
| 2 | Dr. A. U. K. Godamunne. | |
| 3 | Dr. W. M. M. S. Gunarathne. | |
| 4 | Dr. G. L. Jayasinghe | |
| 5 | Dr. T. D. Senarath. | |
| 6 | Dr. B. R. M. Samaratunga | |
| 7 | Dr. S. D. Senanayake | |
| 8 | Dr. K. T. Gunawardena | |
| 9 | Dr Venura. C. Jinangamudalige | |
| 10 | Dr. D. N. Jayalath | |
| 11 | Dr. N. R. Ranasinghe. | |
| 12 | Dr. K. D. S. S. Kumari | |
| 13 | Dr. H. P. Kumarasinghe | |
| 14 | Dr. Achana Obris | |
| 15 | Dr. J. S Shakoor | |
| 16 | Dr. S. J. Jayanetti | |
| 17 | Dr. M. G. R. R. Muhandiram | |
| 18 | Dr. K. Venukhoban | |
| 19 | Dr. I. D. Ediriweera | |
| 20 | Dr. Wijesiri R. D. | |
| 21 | Dr. S. B. Samarajeew | |
| 22 | Dr. S. D. T. L. Kumari | |
| 23 | Dr. S. A. R. K. Samarasinghe | |
| 24 | Dr. R. W. M. M. S. K. Rajapaksha. | |
| 25 | Dr. T. P. Abeykoon | |
| 26 | Dr. D. M. D. Dasanayake | |
| 27 | Dr. C. G. Kohombange. | |
| 28 | Dr. K. N. R. de Silva | |
| 29 | Dr. Rajitha Siriwardana | |
| 30 | Dr. W. D. M. Subasinghe | |

| | Name | Signature |
|---|---|---|
| 31 | Dr. W.M.D.A. Wijayakoon | |
| 32 | Dr. S.G. Abeyratuna | |
| 33 | Dr. E A P M Premarathne | |
| 34 | Dr. M. Krishnapillai. | |
| 35 | Dr. V.A.T.D. Withana Arachchi | |
| 36 | Dr. P.N.G. Fonseka | |
| 37 | Dr. M.W.C.K. Guthige | |
| 38 | Dr. S. L. Ranasinghe | |
| 39 | Dr. E.M.S.K. Senavirathna | |
| 40 | Dr. W.G.S. Thushara. | |
| 41 | | |
| 42 | | |
| 43 | | |
| 44 | | |
| 45 | | |
| 46 | | |
| 47 | | |
| 48 | | |
| 49 | | |
| 50 | | |
| 51 | | |
| 52 | | |
| 53 | | |
| 54 | | |
| 55 | | |
| 56 | | |
| 57 | | |
| 58 | | |
| 59 | | |
| 60 | | |
| 61 | | |
| 62 | | |
| 63 | | |